# පෙර වැකිය

වීරවරයින්ගේ චරිතාපදාන කියැවීම, ඇගයීම, ඉගැන්වීම, වටහා ගැනීම ලොව පිළිගත් විෂය ක්ෂේත්‍රයකි. චරිතායන අධ්‍යයනය නමින් හැඳින්වෙනුයේ තත් මහරු සාහිත්‍යය හැදෑරීමයි. පාඨකයා හට ඉන් ලැබෙනුයේ විපුල ආස්වාදයකි. අධ්‍යාපනයකි. ජීවිතාවබෝධයකි. විනෝදයකි. ප්‍රීතියකි. එමතුද නොවේ. ගුණ නුවණැස පාදා සිය දිවි පෙවෙත සකසා ගැනීමට ආලෝචනා රාශියක්ද ඉන් සූචනය වන බැව් සමාජ මනෝ විද්‍යාඥයන්ගේ අදහසයි.

සූර, වීර, ධීරයෝ ස්වයං ලිඛිත චරිතාපදාන සම්පාදනය කළහ. එනම් තමන්ගේ ජීවිත කථාව කියවන්නන් හට ප්‍රයෝජනවත් වෙතැයි කල්පනා කොට තමන් විසින්ම ලියා තැබීමයි. අප විසින් කියවන ලද විශිෂ්ට ස්වයං ලිඛිත චරිතාපදාන කිහිපයක් සිහිපත් කරනු රිසියෙමි. උපන්දා සිට (මාර්ටින් වික්‍රමසිංහ), විනිවිඳිමි අඳුර (ජී. බී. සේනානායක), පිං ඇති සරසවි වරමක් දෙන්නේ (එදිරිවීර සරච්චන්ද්‍ර), පුංචි පැළේ ගස වෙනා (කේ. ජයතිලක) වැනි කෘතීන් ගැන සඳහන් කළ හැකිය. ථෙර ථෙරී ගාථා - අපදාන පාලියද මෙහිදී විශේෂයෙන් සඳහන් ලැබිය යුතු ඤාණ ධාරාවකි. ඒවා උත්තමගණයේ චරිතාපදානයෝ වෙති. මෙවන් චරිත ලක්ෂ සංඛ්‍යාත ගණනක් අධ්‍යයනය කළ හැකිය. ඒ උදෙසා විශාල වුවමනාවක් හිතේ තිබිය යුතුය.

චරිත නායකයා ඇසුරේ සිටි කෙනෙකු හෝ පසුව විවිධ මූලාශ්‍ර ඔස්සේ එම අපදානය හැදෑරූ ලේඛකයකු හෝ ලේඛක සමූහයක් විසින් සම්පාදිත චරිත කථා තවත් වර්ගයකි. පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල නාහිමි, මොහොට්ටිවත්තේ ගුණානන්ද නාහිමි, වස්කඩුවේ ශ්‍රී සුභූති නාහිමි, වලානේ සිද්ධාර්ථ නාහිමි, වැලිතර යූ. ඒ. ඤාණතිලක නාහිමි, පොල්වත්තේ බුද්ධදත්ත නාහිමි, මඩිහේ පඤ්ඤාසීහ නාහිමි, අනගාරික ධර්මපාල, හෙන්රි ඔල්කොට්, ආචාර්ය ඊ. ඩබ්ලිව්. අදිකාරම්, තෙරේසා මව්, ස්වාමි විවේකානන්ද, මහත්මා ගාන්ධි, නෙල්සන් මැන්ඩෙලා, ශ්‍රී සත්‍ය සායි, ශීර්ඩි සායි, ඇල්බට් අයින්ස්ටයින්, ශ්‍රී චන්ද්‍රරත්න මානවසිංහ, මහගම සේකර, අමරදේව වැනි චරිත මට සිහිපත් වනුයේ ඉන් අප ලද ආභාසය කරනකොට ගෙනය. චරිතාපදාන, එම චරිතයන්හි කාර්යසාඵල්‍යතාව, අවංක පාඨකයාට ලබාදෙන ලෝකාවලෝකනය අතිමහත්ය.

මෙම වෙසෙසි සටහන සකස් කරනුයේ අපේ බාල කාලේ සුධීමත් වීරවරයකු පිළිබඳ සිසිර දිසානායකයන් විසින් විරචිත අනඳපති - ජී. ඩබ්ලිව්. රාජපක්ෂ චරිතාපදානය සම්බන්ධ වටිනාකම් සුදීප්ත කරලීමටයි. මෙම කුඩා සැමරුම් වැකිය ලිවීමට මා තෝරා ගැනීම අප ලද ඉමහත් ආස්වාදයකි. අගනා දුර්ලභ අවස්ථාවකි. ඊට යෝග්‍ය ආනන්දීයයන් විශාල සංඛ්‍යාවක් ඉදානීන්තනයෙහි ජීවත්ව සිටින හෙයිනි. එය ම'වෙත බාර කිරීමම වාසනාවකි. අභියෝගයකි. ඊට තුති පිරිනමමි.

පැරැණි පඬුවන් ග්‍රන්ථ ඇගැයීමේදී, ප්‍රමාණ කිරීමේදී සංඥා, නිමිත්ත, කත්තාරං, පමාණං, පයෝජනම් යනු විසින් පංචාංගික නිර්ණායක විනිශ්චය කරනු ලැබේ. සංඥා වූ කලි ග්‍රන්ථ නාමයයි. නිමිත්ත වූ කලී එබඳු කෘතියක් රචනා කිරීමේ හේතු සාධකයි. මේ රචයිතෘ - කතුවරයා, මෙබන්දක් කිරීමට සුදුසුද කෙසේද යනු කත්තාරං වේ. ග්‍රන්ථයේ ප්‍රමාණයත්, මෙබඳු ගතක් පළ කිරීමත් එය කියවා කවර හෝ පාඨකයකු ලබන උදාර උත්තම ඵල ප්‍රයෝජනයෙහි මහිමයත් යන කරුණු ගැනයි. මෙහිදී අදහස් කරනුයේ.

අශාස්ත්‍රීය, නිස්සාර, මුඩු, බොල්, මුග්ධ, මිථ්‍යාදෘෂ්ටික පොතපත, නාටක, සිනමා, ගීත, නැටුම්, වෙළෙඳ දැන්වීම්, සිනමා බයිස්කෝප් දස දහස් ගණනින් බිහිවන වර්තමාන ශ්‍රී ලංකාවේද ජී. ඩබ්ලිව්. රාජපක්ෂ බඳු සුවිශිෂ්ට අධ්‍යාපනඥයකු, විද්‍යාලයාධිපතිවරයකු සම්බන්ධ මෙවන් අද්විතීය ග්‍රන්ථයක් ලියා පළ කිරීමම ජාතික මෙහෙවරකි. යටකී සියලු නිණැයුම් සාධනය වී තිබේ. පූර්ණ වී තිබේ. කවර සමාජයක වුවද පෙනෙන සහ නොපෙනෙන පැති දෙකක් ඇත. ආනන්දය ගැන සෘජුව විද්‍යමාන වන යථාර්ථයට පහර එල්ල කරන දුෂ්ටයෝද සිටිති. එය සමස්ත සිංහල බෞද්ධ අනන්‍යතාවට එල්ල කරන මුෂ්ටි ප්‍රහාරයකි. ආනන්දය ස්වීකෘත අනන්‍යතාව සුරකිමින් පොදුවේ මනුෂ්‍යත්ව සබුද්ධි තත්ත්වයට පත් කළ අධ්‍යාපන වංශ කතාවක්ද, එම ඓතිහාසික සන්දර්භයේ නිර්මාතෘවරු කීප දෙනෙක් වෙති. සෙන්පති ජෝර්ජ් විල්ෆ්‍රඩ් රාජපක්ෂ වූ කලී අග්‍රගණ්‍ය යුගයක ප්‍රදීපස්ථම්භයකි. නොපසුබස්නා වීර්යයෙන් යුක්ත නායකයෙකි. මෙම විබුධයාණන් හට අභියෝග කළ හැකි කිසිවකු එම කාලපරිච්ඡේදයේ සිටියා යැයි කිව නොහෙනා තරම් යථාර්ථයකි. එබැවින් සියල්ල සම්පූර්ණ වී ඇත. පරිච්ඡේද දහයක් පුරා දිග හැරෙන ග්‍රන්ථාවලියේ අංග ප්‍රත්‍යංග කියවන ඔබට ආකර්ෂණයක් වනු ඇතැයි නිරනුමානය. රසබර අර්ථවත් කවිතාවක් පළට කරනු ලබන භාෂා රීතියක් අනුගමනය කළ කතුවරයාණන් නොදන්නා පාඨකයන්ට හඳුන්වාදීම යුතුකමකි.

සිසිර දිසානායක ආදී ආනන්දයීය අතිජාත පුත්‍රයෙකි. වෘත්තියෙන් වරලත් සිවිල් ඉංජිනේරුවරයකු වන ඔහු ට්‍රැෆික් ඉංජිනේරු විද්‍යාපති උපාධිය දිනා ගත්තෙකි. දැනට ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියා ප්‍රාන්තයේ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ ජ්‍යෙෂ්ඨ ව්‍යාපෘති ප්‍රවර්ධන ඉංජිනේරුවකු වන ඔහු විදේශයක ජීවත් වුවද තම කමට, අපේ කමට අපේ ශ්‍රී ලාංකික සිංහල බෞද්ධ සමාජ සංස්කෘතික අනන්‍යතාවට, අභිවෘද්ධියට, ප්‍රතිෂ්ඨාපනයට අප්‍රමාණව ඇප කැප වන්නෙකි. එම කුදු මහත් කටයුතු ප්‍රශංසාර්හ වන අතර පොදු මනුෂ්‍යත්වය හමුවේ ඔහු මානව කේන්ද්‍රණවාදී නොවී අවංකව ක්‍රියාකර ඇති බැව් මම දනිමි. ඔහුගේ දෙමාපියෝ ළබැඳි ගුරුවරුන් වූහ. අවිස්සාවේල්ල සීතාවක මහා විද්‍යාලයේ ඉගෙනුම ලබා පහේ ශිෂ්‍යත්වය සමත්වී ආනන්ද විද්‍යාලයට ඉගෙන ගැනීමට පැමිණුනේ තත් චරිතාපදානයෙහි සෙන්පති ජී. ඩබ්ලිව් රාජපක්ෂ විද්‍යාලයාධිපති සමයේය. ආනන්දයීය ඉතිහාසයේ ස්වර්ණමය සමයකි ඒ. කුඩා කල පටන්ම ක්‍රීඩාවේද, සෞන්දර්ය සාහිත්‍ය ලලිත කලාවේද ප්‍රතිභාසම්පන්න දක්ෂතා පෙන්නුම් කළ සිසිර අනඳ නුවණ සංගමයේ සංවිධායකද විය. බිත්ති පුවත්පත්වලට චිත්‍ර ඇඳ, කවි ලියා සිසුන් අතර උත්තේජනයක් ඇති කළේ නිර්මාණ කලාවටය. ශිෂ්‍ය හට හේවිසි තූර්ය වාදක කණ්ඩායමේ බටනළා වාදකයෙකි. ආනන්දයේ ආරම්භය හා ව්‍යාප්තිය විමසීමේ ව්‍යාපෘති කණ්ඩායමේ සාමාජිකයකු හැටියට රාජපක්ෂ විදුහල්පතිතුමන්ගේ අනුශාසනය යටතේ වසර දෙකක් ආනන්දයීය ඉතිහාසය ගවේෂණය කරමින් මහත් සේ ඇප කැප විය. 75 -80 ආදී ආනන්දයීය සංගමයේ වසර ගණනාවක සංස්කාරක ලෙස ක්‍රියාකාරිකයෙකු වූ ඔහු ගීත රචනා දෙසිය ගණනකට වඩා රචනා කළ ජනකාන්ත ගීත ප්‍රබන්ධයකු බැව් බොහෝ දෙන දනිති. ආචාර්ය වික්ටර් රත්නායක, විශාරද නන්දා මාලිනී, ලයනල් රන්වල, ආචාර්ය රෝහණ වීරසිංහ, විශාරද දීපිකා ප්‍රියදර්ශනී, සුනිල් එදිරිසිංහ, විශාරද අමරසිරි පීරිස්, විශාරද නීලා වික්‍රමසිංහ, බන්ධුල විජේවීර, කරුණාරත්න දිවුල්ගනේ, නිරෝෂා විරාජිනී, කීර්ති පැස්කුවල්, රොඩ්නි වර්ණකුල, රොහාන් ශාන්ත බුල්ගොඩ, විශාරද ජානක වික්‍රමසිංහ, විශාරද නෙලූ අධිකාරි, සහන් රන්වල වැනි ගායන ශිල්පීහු ඔහු ලියූ ගී ගැයූහ. නුඹෙ සිරික්කියට, අතුරු මිතුරු ළමා ගී, සිදංගනා (වික්ටර් රත්නායක), සිනාවී, "ආදරණියයි නම්" (රෝහණ වීරසිංහ) වැනි ගී තැටි ඔහු විසින් එළි දක්වන ලදී.

වික්ටර් ගී වීමංසා වික්ටර් රත්නායක තනු, සංගීත, ගායන විමසුම ඉමහත් පරිශ්‍රමයක ප්‍රතිඵලය එළිදැක්වූ ග්‍රන්ථයකි. ඕස්ට්‍රේලියාවේ සිංහල ප්‍රජා මාසිකවලට නිතර ලිපි රචනා කළ ඔහු අවුරුදු, වෙසක්, සිංහල භාෂා පාසල්වල සංස්කෘතික වැඩසටහන්වල නොපිරිහෙලා, තම ශ්‍රමය වැය කළ, පුද කළ මහත්මයෙකු ලෙස සුපතළය. මේ ගුණ කීර්තනය ම'විසින් ගෙනහැර පාන ලද්දේ කීර්තිමත් අතිදුර්ලභ විද්‍යාලයාධිපතිවරයකු වූ සෙන්පති ජී. ඩබ්ලිව්. රාජපක්ෂ විබුධයාණන්ගේ ජීවිත කථාව ආනන්දයේ ඉතිහාසය, පසුබිම, ශ්‍රී ලාංකික අධ්‍යාපන වංස කථාවේ ආනන්දයට හිමිවන තැන, එම උච්ච ආස්ථානයට ආනන්දය ඔසවා තැබීමට රාජපක්ෂ සුධීමතුන්ගේ අප්‍රතිහත ධෛර්යය, වීර්යය, ඇප කැපවීම, ස්වීයත්වය, අසිරිමත් බලමහිමය, පරමාදර්ශීය නායකත්වය ලක්ෂණ පළට කරමින් මේ ග්‍රන්ථය ලියන්ට සිසිර දිසානායක මොනවට සුදුසු වන්නේ දැයි පෙන්නුම් කිරීමටයි. 1960 දශකයේ මැද භාගයේ සුප්‍රකට පාලිත පෙරේරා ගුවන් විදුලිය නිෂ්පාදක ක්‍රිකට් විස්තර ප්‍රචාරකතුමා මැදිහත්වීමෙන් තම සොයුරිය වූ ආනන්දයේ එවක ඉගැන්වූ අවංක ගුරුතුමියක වූ අනුලා රන්කපුගේ මහත්මිය මගින් රාජපක්ෂ විදුහල්පතිතුමාට කරුණු පැහැදිලි කොට ආනන්දයේ ඉගෙන ගැනීමට මා හට දිව්‍යමය වරප්‍රසාදයක් ලබා දුන් හැටි මට මතකයි. ඒ සැමටම සදා ණය ගැති වෙමි. ම'පියාණන් විමල් අභයසුන්දර මහතා ආනන්දයට ගීත ප්‍රබන්ධ දෙකක් රචනා කර දුන්නේය. ඒ ආනන්ද බුද්ධ මන්දිරය විවෘත කරන අවස්ථාවේදීය. "රන්මල් පිපිලා අද ආනන්දේ" සහ අදත් ගැයෙන "ආනන්දයි ආනන්දයි ආනන්දේ අද ආනන්දයි" ගීත දෙකයි. එම ගීතයන්හි තනු සංගීත නිර්මාණය කළේ අනිල් මිහිරිපැන්න සංගීත ආචාර්යතුමන්ය. මේ ආනන්දයි ආනන්දයි ගීතය ගැන ඇති වූ ගැටලුවක් නිරාකරණය කිරීමට මා විදුහල්පති නිල කාමරයට ගිය අවස්ථාවේ රාජපක්ෂ විදුහල්පතිතුමා ශිෂ්‍යයකුගේ පෞරුෂය ස්වීයත්වය වඩා ගැනීමට මාහට දුන් උපදෙස් මුතු, මැණික්, දියමන්ති, රත්තරන්වලට වඩා අගනේය. අපට හැම විටම ඉගැන්වූයේ කොන්ද කෙළින් තබා ගැනීමට,  කෙනෙකුගේ ඇස් දෙක දිහා බලා නිර්භයව ප්‍රියමනාපව කාරුණිකව කතා බහ කිරීමය. අපි බොහෝ දෙනා ආනන්දයෙන් ස්වේච්ඡා සේවය ඉගෙන ගතිමු. රට දැය සමයට මිනිසත් කමට වැඩ කරන කලාව, ශිල්පය, ජීවත්වීමේ අගය, සමාජ සේවය, රාජපක්ෂ ප්‍රාඥයන් විසින් සෘජුව තමන්ද, ධර්මාචාර්ය හිමිවරුන් මෙන්ම ගුරුවරුන් මගින්ද සිසුන්ට පහදා දුන් පාඩම් අනර්ඝ වේ. ආදර්ශවත් වේ. අවවාදයට වඩා ආදර්ශය උතුම් බැව් කියා දුන්නේ රමණීය පවිත්‍ර ආකර්ෂණීය ආකාරයටය. මේ කරුණු ගැන එක් දිනක් විශ්වවිද්‍යාල ආචාර්යවරයකු ලෙස ඇඹිලිපිටියේ පිහිටි තරුණ තරුණියන් පුහුණු කිරීමේ මධ්‍යස්ථානයේ ම'විසින් කළ දේශනයක් ද ඉදිරිපත් කරන ලද්දේ රාජපක්ෂ පාණ්ඩිත්‍යය, පෞරුෂය, ස්වීයත්වය ඉදිරිපිටදීය. එවකට එතුමා ආනන්දයෙන් විශ්‍රාම ගොස් සිටියේය. සැබෑ ගුරුවරයකු උත්තමධීර විදුහල්පතිවරයකු හා මානවහිතවාදී ශ්‍රී ලාංකිකයකු වන මේ අප්‍රමාණ පුරුෂයා පිළිබඳ සිසිර දිසානායක රචනා කළ අපදානය එය කියවන කවරකුට වුව හද පියුම විකසිත කරන පරමාදර්ශී හා ගුණවඩන ග්‍රන්ථයකි. මා හැඟි කර්තව්‍යය ඉටුකළ සිසිර දිසානායක හා ඊට දිරි දුන් ආදි ආනන්දීයයන් සැමට අපගේ ශුභාශීර්වාදය, ගෞරවය පිරිනමනුයේ අපරිමිත ප්‍රහර්ෂයකිනි.

නොදන්නා දෙය දැන ගැනීමටත්, දන්නා දෙය සැකහැර දැන ගැනීමටත් සම්භාෂා පවත්වනු යැයි කියමනක් ඇත.

එබැවින් මෙම ඵලදායි සම්භාෂාව අපගේ ආදරණීය මාර්ගෝපදේශක ආනන්ද විද්‍යාලයාධිපති සෙන්පති ජී. ඩබ්ලිව්. රාජපක්ෂ වීර වික්‍රමාන්විත ක්‍රියා කළ ප්‍රාඥයාණන් පිළිබඳවයි.

මේ කෘතිය පාඨක ඔබට අභිනන්දනයක් වේවා යයි ප්‍රාර්ථනා කරන්නෙමි.

**මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දර**
මානව විද්‍යා අධ්‍යනාංශය
ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලය
ගංගොඩවිල

# කතු වදන

"පුතා කා එක්කද අද ආනන්දයට ආවෙ?"

"අම්මත් එක්ක..."

"ඇයි, තාත්තා ආවේ නැද්ද?"

පුතා බලනවා වට පිට.

පුතා මේ ඇවිත් ඉන්නේ අම්මයි තාත්තයි දෙන්න ම එක්ක. පහේ ශිෂ්‍යත්වයෙන් සමත් වෙලා විද්‍යාලයට ඇතුළත් වෙන්න ආව දවසේ ඒ හැම පුතෙකුට ම වචනයකින් දෙකකින් කතා කරන්න අමතක කළේ නෑ අනඳපතිතුමා.

"ඔබතුමා මොකක්ද කරන රැකියාව...? ඒ අනඳපතිතුමා.

"සර් මම සංගීත ගුරුවරයෙක්..." ඒ පුතාගේ තාත්තා.

"පුතාත් ඉන්න එකේ දැන් නරකද ආනන්දයට මාරුවක් හදා ගත්තොත්...?"

මේ අනඳපති, දේශබන්දු කර්නල් ජෝර්ජ් විල්ෆ්‍රඩ් රාජපක්ෂ පිළිබඳව මාගේ මුල් ම මතකයයි.

ඕනෑ ම අයෙකුට නොයෙක් ආකාරයේ සිහින තියේ...

ආනන්ද විද්‍යාලයේ ළදරු පන්තියට වයස අවුරුදු තුනහමාරේදී ඇතුළත්ව, සැටවන වියේදී එහි විදුහල්පතිවරයා වශයෙන් විශ්‍රාම ගිය අසම-සම විශිෂ්ට අධ්‍යාපනඥයෙකුගේ චරිතාපදානය ලියන්නට වේ යැයි ගුරු යුවළකට දාව උපන් දස වියැති දරුවෙකු ලෙස එදා මම සිහිනයකිනුදු නොසිතුවෙමි.

දේවානම්පියතිස්ස නිරිඳුන් විමසූ මිහිඳු මහරහතන් වහන්සේ ලෙසින්, මා විමසූ අනඳපතිතුමාගේ පැනයේ වූ යටි අරුත පසිඳ සටහන් තබන්නට දිනයෙක මා හට වරම් ලැබේ යැයි එදා දෙමව්පියන් අතේ එල්ලී සිටි මා සිහිනයකිනුදු නොසිතුවෙමි.

දුටු සැණින් පුද්ගලයින් හඳුනාගෙන, තමන් දිවි හිමියෙන් කැප වී කටයුතු කරනා ආනන්දයේ අභිවෘද්ධිය වෙනුවෙන් සුදුස්සන් ගොනු කරගන්නට දරනා ප්‍රයත්න පිළිබඳව ලියන්නට වේ යැයි වසර 1972 දී මම සිහිනයකිනුදු නො සිතුවෙමි.

යටත් විජිත වාදීන්ගෙන් තමන්ගේ මව්බිම බේරා ගැනීමට දිවිහිමියෙන් සටන් වැදුණ සීතාවක රාජසිංහ නිරිඳුන් වාඩිලාගත් ජය බිම වූ පරණවාඩියේ පිහිටි අනඳ බිමේ ඉන්ද්‍රඛීලයක් ලෙසින් සුදුවතින් නැගී සිටි අනඳපතිතුමාගෙන් අප ලද පූර්වාදර්ශ නම් බොහෝමයි. “ආනන්දයේ ආරම්භය සහ ව්‍යාප්තිය” ව්‍යාපෘතියේදී නම් සතියකට හෝ දෙකකට වරක් කණ්ඩායමක් සමඟින් එතුමා මුණගැසීමට අවස්ථාව ලදිමි. ආනන්දයේදී මෙන් ම ශ්‍රී ලංකා යුද හමුදා ශිෂ්‍ය භට කඳවුරුවලදීත් අනඳ සෙන්පතිතුමා දුරින් හෝ දැක ගන්නට, පූර්වාදර්ශ ලබා ගන්නට මා හට ඉඩ හසර ලැබුණේ විද්‍යාලයීය යුද හමුදා ශිෂ්‍ය භට හේවිසි තූර්යවාදක ඛණ්ඩයේ බටනළා වාදකයකු ලෙසිනි.

ආනන්දයෙන් “විශ්‍රාම” ගිය ද විශ්‍රාමය නොරිසි වූ කර්නල් ජී. ඩබ්ලිව්. රාජපක්ෂයන් ඇඹිලිපිටියේ යෝදගම පිහිටි ජාත්‍යන්තර ග්‍රාමීය නායකයන් පුහුණු කිරීමේ ආයතනයේ මුල් ම අදියුරුව, නැවත වතාවක් රාජකාරිමය වශයෙන් ද මා හට සමීපවීම දෛවෝපගතයි. සැබවින් ම එය මගේ වෘත්තීය මෙන් ම පෞද්ගලික ජීවිතයේද හැරවුම් ලක්ෂ්‍යයක් සනිටුහන් කිරීමට සමත්විණැයි කිවහොත් නිවැරදියි.

කෙසේවතුදු, අනඳපතිතුමන් අවසන් වතාවට මා හට දැක ගන්නට ඉඩහසර ලැබුණේ ආනන්ද විද්‍යාලයේ ක්‍රීඩාංගණය එතුමන් නමින් නම් කළ දායි. අවසන් වතාවට එතුමන්ට ප්‍රණාමය කරන්නට වරම් ලද එදින ආදි ශිෂ්‍යයෙකු ලෙස යම් යුතුකමක් ඉටු කරන්නට මුල පිරීමත් දෛවෝපගතයි. යත්න පෙරේරා ජ්‍යෙෂ්ඨ ආදි ආනන්දයීය සොයුරා සමඟ එක්ව “ආදී ආනන්දයීය හේවිසි තූර්ය වාදක කවය” පිහිටුවා ගන්නට හේතුව වූයේ එදින අප දෙදෙනා ක්‍රීඩාංගණයේදී ලද අත්දැකීමක්.

ජීවිතයට විටින් විට දුරස්ථව හෝ සමීපව සිටිමින්, අනියම් ලෙසින් හෝ ධනාත්මක බලපෑම් ඇති කළා වූ ප්‍රබල පූර්වාදර්ශී චරිතයක චරිතාපදානය ලේඛනගත කරන්නට ලැබීම මාගේ මහත් වූ භාග්‍යයක්. ඉන් මා ලද දේ මෙන් ම උගත් දේ බොහෝමයි. ඉදින් ඒ භාග්‍ය උදාකර දෙමින් සම්පත් ළඟා කර දෙමින් උරදුන් පිරිස වෙනුවෙන් කෙටියෙන් හෝ පුණ්‍යානුමෝදනා පිරිනමන්නට දෙන්න මට අවසර කරුණාවෙන්...

“මචං, උඹ තමයි මේක ලියන්නේ...”

ඕස්ට්‍රේලියාවේ වික්ටෝරියානු ආදී ආනන්දයීය සංගමයේ හිටපු සභාපතිවරයෙකු වන රෝහිත බෝගහවත්ත, අපගේ සමකාලීන සොයුරා, සංගමයේ 25 වන සංවත්සරය වෙනුවෙන් දියත් කරනා නවත ම ව්‍යාපෘතිය පිළිබඳව විස්තරය අවසන් කළේ එලෙසින්. සංගමයේ 25 වන වසරේ සභාපති, දුෂාන් බටුගෙදර කනිටු සොයුරා ඇතුළු කමිටුව විසින් භාරගන්නා ලද මේ ව්‍යාපෘතියේ වගකීමක් මා වෙත පැවරුණ ඒ මොහොතේ ගත මෙන් ම සිත ද කිලිපොළා ගිය නියාව කිසිදා අමතක නොවේ.

මේ වන විට විශ්‍රාමයෙන් පසුවන සාර්ලිස් අමරසිරි විදුහල්පතිතුමා ගෙන් මුලින්ම අකුරු කියවාගෙන අවිස්සාවේල්ලේ සීතාවක මහා විද්‍යාලයේ දෙවෙනි ශ්‍රේණියේ පන්තිභාර ගුරුතුමිය වුණ අම්මාගෙන් අකුරු හුරු වූ මතකය සිහින් විදුලි රේඛාවක් මෙන් සිත හරහා ඒ වෙලාවේ ඇඳී ගියේ ක්ෂණිකව. ආනන්ද විද්‍යාලයේ අටවෙනි ශ්‍රේණියේදී සිංහල විෂය පෙවූ කේ. එල්. පෙරේරා ගුරුතුමියත්, දහවන ශ්‍රේණියේ දී සිංහලය සිතට කැවූ එච්.ජී.ධර්මදාස ගුරුතුමාත් ඒ රිදී විදුලි රේඛාව කෙළවරට එක්ව, නෙත් කෙවෙණි අද්දර පුපුරා ගියේ කඳුළක තෙතමනය දෙකොපුලට මුහු කරමින්. “අනඳ නුවණ” සංගමයේ බිත්ති පුවත්වලට ලියූ කවි, ඇඳි සිත්තම් මෙන් ම ආදී ආනන්දයීයන්ගේ 75-80 කණ්ඩායමේ සංස්කාරක ලෙස වසර ගණනාවක් තිස්සේ ලියූ දේ ක්ෂණිකව ඒ මතකයට රසයක් නැංවූයේ කඳුළින් මුවඟට දැනුණු රසයත් සමඟින්.

“දුෂ්මන්තත් රෙකමන් කළා උඹව...”

“දුෂ්මන්ත කරන්නාගොඩ සොයුරාගේ සභාපතිත්වය යටතේ 75-80 කණ්ඩායමට මගෙන් ලද දායකත්වය නිසා වෙන්නට ඇති ඒ නිර්දේශ කිරීම. ඕස්ට්‍රේලියාවේ මෙල්බන් ප්‍රජා පුවත්පත්

තුනකට මාසිකව මා සම්පාදනය කරනා ලිපි පෙළත්, ප්‍රජා ගුවන් විදුලි නාලිකාවලට ඇති මාගේ දායකත්වයත් පිළිබඳව දන්නා රෝහිත සොයුරා මා ගැන තැබූ විශ්වසනීයත්වය පිළිබඳවයි මාගේ මුල් ම පුණ්‍යානුමෝදනාව.

"මේ මාස්කෝරාලගේ යෝජනාවක්..."

මේ අනගි යෝජනාව ගෙන ඒම පිළිබඳවත්, බොහෝ තොරතුරු එක්රැස් කරදීම වෙනුවෙනුත්, අදාළ අය වෙත මහත් කැප වීමෙන් ගොස් සම්මුඛ සාකච්ඡා පවත්වා ඒවා ලැබෙන්නට සැලැස්වීම වෙනුවෙන් අපගේ පුණ්‍යානුමෝදනාව මී ළඟට හිමි වෙන්නේ රවී මාස්කෝරාල දෙටු සොයුරාටයි.

මේ ව්‍යාපෘතිය දියත් කරවීමේ බර කරට ගත් එවක සභාපති ධුරය දැරූ දුෂාන් බටුගෙදර මල්ලී, වර්තමාන සභාපති නාමල් ප්‍රේමරත්න මල්ලී ප්‍රමුඛ වික්ටෝරියානු ආදී ආනන්දයීය සංගමයට මාගේ ළෙන්ගතු පුණ්‍යානුමෝදනාව පිරිනැමෙන්නේ විශේෂයෙන් ම "අනඳපති" වෙනුවෙන් දැක්වූ මූල්‍යමය දායකත්වය නිසයි. මූල්‍යමය සහයෝගයට අමතරව මේ තරුණ පිරිස දැක් වූ උනන්දුව ප්‍රශංසනීයයි. අනඳපතිතුමා යට කී සභාපතිවරුන්ගේ කාල වකවානුවලට පෙර වූ චරිතයක් වුව ද මේ වෙනුවෙන් ඔවුන් ආශක්තව කටයුතු කළේ මා බලාපොරොත්තු වූවාටත් වඩා ඉහළින්. ඒ රාජපක්ෂ සුධීමතාණන් පිළිබඳව වූ මනා වැටහීම නිසයි.

ව්‍යාපෘතිය දියත් කිරීම සඳහා පත් කෙරුණා වූ කමිටුවේ අනිකුත් සාමාජිකයන් වුණ, ප්‍රසන්න ද සිල්වා, සරත් ප්‍රනාන්දු, රවී මාසකෝරාල, රුක්මන් විමලසූරිය මෙන් ම දුෂාන්, නාමල් මල්ලිලාත්, රෝහිත බෝගහවත්ත සොයුරාත් මා හට ලබා දුන් වාචික මෙන් ම මානසික සහයෝගයත්, සපයා දුන් තොරතුරුත් අමිලයි. ඉදින් ඒ පිරිසටත් මාගේ හෘදයාංගම පුණ්‍යානුමෝදනාව පිරිනැමෙයි.

"අනඳපති" ව්‍යාපෘතිය තමන් පිළිගත් ව්‍යාපෘතියක් ලෙස පිළිගෙන සහයෝගය දක්වමින් මෙන් ම "ආනන්දය 125" කෘතියෙන් කරුණු සහ ඡායාරූප ලබා ගැනීමට අවසර ලබා දෙමින් දුන් සහයෝගය වෙනුවෙන් සභාපති දුෂ්මන්ත කරන්නාගොඩ සොයුරා ප්‍රමුඛ ආදි ආනන්දයීය මව් සංගමයට අපගේ මීළඟ පුණ්‍යානුමෝදනාව පිරිනැමෙයි.

සභාපති ගාමිණී ජයරත්න, යත්න පෙරේරා, රවී මාස්කෝරාල ඇතුළු ආදී ආනන්දයීය හේවිසි තූර්ය වාදක කවයටත්, ජයන්ත වික්‍රමසිංහ, ඉසුරු සමරසිංහ, ප්‍රසන්න ද සිල්වා, දර්ශන හෙට්ටිආරච්චි, දීපාල් සූරියාරච්චි ඇතුළු සියලු ආදී ආනන්දයීයන්ටත් අපගේ පුණ්‍යානුමෝදනාව හිමි වෙන්නේ අපවෙත තොරතුරු ලබා දෙන්නට දැරූ ප්‍රයත්නයන් නිසයි. කර්නල් ජී. ඩබ්ලිව්. රාජපක්ෂ අනඳපතිතුමා විසින් රැස්කර ගැනීමට යෙදුණ පුවත්පත් ලිපි ඒකතුවත්, ප්‍රසන්න ද සිල්වා ජ්‍යෙෂ්ඨ ආදී ආනන්දයීය සොයුරා ලියා එවූ මතක සටහන් පෙළත් අපහට වටිනා සම්පත් විය.

පූජ්‍ය දිවියාගහ යසස්සී ස්වාමීන්වහන්සේ, බර්ටි ප්‍රනාන්දු, තිලක් වීරසිංහ, රංජිත් පී. විතාන, රංජිත් මදුරප්පෙරුම වැනි ආනන්ද විද්‍යාලයීය ආචාර්යවරුන්ගෙන් ලද සහාය ද මෙහිදී ගෞරවයෙන් සිහිපත් කරන්නේ ඒ සැම සියලු දෙනාටම පුණ්‍යානුමෝදනා පිරිනමමිනි. මේ සද්කාර්යයට එලෙසින් දායක වූ බර්ටි ප්‍රනාන්දු ආචාර්යවරයා මෑතකදී සිය ජීවිතයෙන් සමු ගැනීම කනගාටුදායක පුවතකි.

"ආනන්දයේ ආරම්භය හා ව්‍යාප්තිය" ව්‍යාපෘතියේ සිසු නියාමක ලෙස කටයුතු කළ මහේන්ද්‍ර කාලිංගමුදලි, මෙන් ම ප්‍රියන්ත ජයවික්‍රම, නිහාල් සුරංජි, රවිනාථ ආරියසිංහ, ජගත් අල්විස්, හර්ෂ ජයලත්, රංජන් පහළවත්ත, සරත් ගාමිණී පෙරේරා වැනි මාගේ පන්ති මිත්‍රයින් අපේ කාලයේ විදුහල්පතිතුමා ගැන මතකය අවදි කළේ අපේ ම සැටියෙන්. පන්ති මිත්‍ර කැළටත් පින්. තොරතුරු ලබාදීමේදී අප හට දායක වූ බොහෝ පිරිසක් වෙත්. මෙහි ලා වෙසෙසින් නම් සඳහන් නොවුණ සියල්ලන් හට පුණ්‍යානුමෝදනා ග්‍රන්ථය අග "අනුමෝදනා" යටතේ පිරිනැමෙයි.

"චරිතාපදානයක්" යනු හුදෙක් පාසල් හා වෘත්තීය ජීවිතවලට පමණක් සීමා වන්නක් නොවේ. දේශබන්දු කර්නල් ජී. ඩබ්ලිව්. රාජපක්ෂයන්ගේ චරිතාපදානය ලිවීම ආරම්භයේදී ම මාගේ පන්හිඳ

තුඩ'ගට වියළි බවක් දැනුණේ එතුමාගේ පෞද්ගලික ජීවිතය පිළිබඳ රසවත්, හරවත් තොරතුරු අල්ප වූ නිසයි. "අනඳපති" වෙනුවෙන් රැස් වූ ලිඛිත, වාචික, දෘශ්‍යමය මෙන් ම විදුලිමය තොරතුරු අතර සරද්දී පන්හිඳට යම් තෙතමනයක ඉඟියක් පෑවේ කෞෂාල් රාජපක්ෂ මහත්මා සිය "මහප්පා" සහ "කමලම්මා" පිළිබඳව ලියා එවා තිබුණු ලිපියයි. ඒ ඉඟියට අනුව දූෂාන් බටුගෙදර මල්ලීගෙන් ලැබුණ දුරකථන අංකයෙන් කෞෂාල් අයියා ඇමතුවෙමි.

"අපේ පවුලේ තොරතුරු ගොඩක් දන්නේ මහින්ද ද ලැනරෝල් ඥාතියා. එයාට දෙපැත්තකින් ම නෑකම් තියෙනවා. අනික මහප්පලා එක්ක ම හැදුණ වැඩුණ "ඕල්ඩ් ආනන්දියන්" කෙනෙක්..."

කර්නල් ජී. ඩබ්ලිව්. රාජපක්ෂයන්ගේ බාල සොයුරු ඇලන් රාජපක්ෂ මහත්මයාගේ පුත් ඉන්ද්‍ර කෞෂාල් රාජපක්ෂ මහත්මාට පින් පමුණුවන්නේ ලියූ ලිපියත්, මේ යොමු කරවීමත් ස්තුතිපූර්වකව සිහිපත් කරමින්.

"අනඳපති" චරිතාපදානයේ "ෆ්‍රෙඩී" අනු චරිතය සම්පූර්ණයෙන් ම ඉස්මතු වෙන්නේ ජ්‍යෙෂ්ඨ ආදී ආනන්දීය මහින්ද ද ලැනරෝල් මහත්මා සමඟ 2020 ජූලි මාසයේ පටන් දිනපතා ම, නොවරදවා ම පැයක්, දෙකක් අතර කාල පරාසයක සය මසක් තිස්සේ දුරකථනයෙන් පැවැත්වීමට යෙදුණ කතිකා තුළින්. දිනයේ නියමිත වේලාවකදී කතිකාව ඇරඹීම විනයක් ලෙසින් පවත්වාගෙන, සිය මතකයෙන් රාජපක්ෂ පවුලේ තොරතුරු කියාපාමින් ලැනරෝල් මහත්මා කළ දැනුවත් කිරීම් නිසා ම යි පරිපූර්ණ "අනඳපති" චරිතය ගොඩ නගාගත හැකි වූයේ. හුදෙක් තමන් දන්නා කරුණු මතු නොව, ඉසිපතන විද්‍යාලය, මියුසියස් විද්‍යාලය, ශ්‍රී ලංකා ශිෂ්‍ය භට බළකාය, ශ්‍රී ලංකා විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව වැනි ආයතනවලට පෞද්ගලිකව ගොස් රැස් කරගත් තොරතුරු ද අප වෙත ලබා දෙමින් ලැනරෝල් මහත්මා මේ වනතුරුත් කරනා කැප කිරීම අති විශිෂ්ටයි. කර්නල් ජී. ඩබ්ලිව්. රාජපක්ෂයන්ගේ දෙටු පුත් සරෝජ් රාජපක්ෂ මහත්මා වෙතින් මෙන් ම දියණිය, රමණී රාජපක්ෂ මහත්මිය වෙතින් ද ඡායාරූප යනාදිය ගෙන්වා අප වෙත දායාද කළේ වික්ටෝරියානු ආදී ආනන්දයීය සංගමය ඔවුන් වෙත කළ දැනුවත් කිරීම්වලට අමතරවයි. ගම්පහ උඩුගම්පොළ ප්‍රදේශයේ නෑ සියන් වෙත ගොස් කරුණු එක් රැස් කරගන්නට වූ උනන්දුව ද ඉතා වටියි. ආනන්දයේ ආචාර්යවරයෙකුව සේවය කර, ප්‍රධානාචාර්යවරයකුව ඉවත්ව ගිය කේ. ඩී. ද ලැනරෝල් ගුරු පියාණන්ගේ පුතෙකු වන නීතිවේදී ශාස්ත්‍රපති මහින්ද ද ලැනරෝල් මහත්මා වෙත භක්ත්‍යාදරයෙන් පිරිනැමෙනා අපගේ පුණ්‍යානුමෝදනාවයි මේ.

කර්නල් ජී. ඩබ්ලිව්. රාජපක්ෂ චරිතය තුළ අප නොදත් "ෆ්‍රෙඩී" චරිතය ගොඩ නංවාගන්නට පවුලේ උදවියගෙන් ලද සහය ද අමතක කළ යුතු නොවේ. මහින්ද ද ලැනරෝල් මහත්මාගේ මාර්ග යෙන් මේ සද්කාර්යයට දායක වූ සරෝජ් රාජපක්ෂ මහත්මාටත්, රමණී රාජපක්ෂ මහත්මියටත් අපගේ පුණ්‍යානුමෝදනා හිමිවෙයි. තුරුණු වියේදී ම ජීවිතයෙන් සමුගත් රාජපක්ෂයන්ගේ කනිටු පුත් සුරාජ් රාජපක්ෂ මහත්මාගේ ප්‍රිය බිරිඳ සන්ධ්‍යා රාජපක්ෂ මහත්මියත් ඔවුන් දෙපළගේ පුත්, සංජීව රාජපක්ෂ මහත්මාත් දුරකථනයෙන් සම්බන්ධ වී ලබාදුන් තොරතුරු "අනඳපති" අග භාගය නිර්මාණය කරගන්නට බෙහෙවින් ඉවහල් විය. ඉදින් ඔවුන්ටත් මාගේ පුණ්‍යානුමෝදනා.

"අනඳපති" පසු වදන වෙනුවෙන් තමන් ලියූ ලිපියකින් කොටසක් පළකිරීමට මහාචාර්ය ජේ. බී. දිසානායකයන් අවසරය ලබා දුන්නේ ඉමහත් බැතියෙන්.

"ඒක මටත් ගෞරවයක්... බොහොම ස්තුතියි ඒ අදහසට..." මහාචාර්යතුමා සිය පන්තිභාර ගුරුවරයෙකු වූ අනඳපතිතුමා වෙනුවෙන් ගෞරවාන්විත වූයේ එලෙසින්.

මා මින් පෙර ලියූ "වික්ටර් ගී වීමංසා" ගී විමර්ශනාත්මක ග්‍රන්ථය වෙනුවෙන් පෙරවදන ලියා දුන් ප්‍රවීණ ගී පද නිබන්ධක මහාචාර්ය ප්‍රණීත් අභයසුන්දරයන් "අනඳපති" වෙනුවෙන් ද පෙරවදන ලියා දුන්නේ ඉමහත් උනන්දුවෙන්, ගෞරවයෙන්...

"මොකද දැන් පොතේ තත්ත්වය...? අපෙන් මොනවද කෙරෙන්න ඕන මල්ලී...,?"

නිරතුරුව ම මා උනන්දු කරවමින්, උර දෙන්නට සැදී පැහැදී සිටිනා ප්‍රණීත් අභයසුන්දරයන් තමන්ගේ කාලයේ විදුහල්පතිතුමා වෙනුවෙන් කෙරෙනා මේ සත්කාරයට දායක වූයේ මහත් සතුටින්.

ආදි ආනන්දයීය මහාචාර්යවරුන්ට අපගේ පුණ්‍යානුමෝදනාව යට කී දායකත්වය වෙනුවෙන්. වසර 2020 මාර්තු අග ග්‍රන්ථය ලිවීම ඇරඹුණ ද මඳක් පමා වූයේ මාගේ දකුණු අතෙහි වූ ආබාධයක් නිසාවෙනි. එය යථා තත්ත්වයට පත් කළ නිමන්ත විජේවර්ධන භෞත චිකිත්සක මහත්මාටත් පින්.

පිටු පුරා බොහෝ දේ ලියුව ද, ඒවා මනා සේ යතුරුලියනය කර සෝදුපත් කියවා මුද්‍රණය කර දුන් "ෆාස්ට් ඇඩ්ස්" ආයතනයේ අධිපති ප්‍රේම් දිසානායක මහත්මාත් එම ආයතනයත් නොවන්නට මේ ප්‍රමිතියට, මේ ආකාරයෙන් මේ ග්‍රන්ථය ඔබ-අප අතට පත් නොවනු ඇත. වසංගත සමයක එකිනෙකා මුණ නො ගැසී දෙරටක සිට ගත් මේ උත්සාහය ජයගන්නට වඩාත් ඉවහල් වූයේ "ප්‍රේම් අයියාගේ" කාරුණික බව, ඉවසිලිවන්ත බව මුසුවුණ පරිණත බවයි. "ෆාස්ට් ඇඩ්ස්" ආයතනයටත් ප්‍රේම් දිසානායක මහත්මාටත් මේ පුණ්‍යානුමෝදනා හිමි වෙන්නේ ඒ වෙනුවෙන්.

මොනයම් ආකාරයක රසකැවිල්ලක වුව ද දවටනය ආකර්ෂණීය නොවුණහොත් එය රසවතුන් අතර නිසියාකාරව බෙදී නො යේ. "අනඳපති" චරිතයට ම ගැළපෙන ලෙසින් අනඳ වර්ණ සංකලනයෙන් යුතුව ආකර්ෂණීය කංචුකයක් නිර්මාණය කර දුන් ජෝන් කිරින්දගේ ආදී ආනන්දයීය සොයුරාටත් ඒ සඳහා අපගේ පුණ්‍යානුමෝදනාව හිමි වෙයි.

2020 වසරේ නව මසක් පුරාවට මේ චරිතාපදානයේ කටයුතු වෙනුවෙන් මා හට වෙන් කිරීමට සිදු වූයේ මාගේ පුද්ගලික කාලවේලාවයි. එහිදී මේ සියල්ල විඳ දරාගනිමින් හුදෙකලා වූ ප්‍රිය බිරිඳ පද්මාටත්, නිතර මා උනන්දු කරමින් විමසා බැලූ දියණිය සරිනිටත්, පුත් පියන්ටත් මේ පුණ්‍යානුමෝදනාවෙන් කොටසක් හිමි වෙයි. සෑම විටම මව්බිමේ සිට මගේ කටයුතු පිළිබඳ උනන්දුවන සාගරිකා සහ ගෝපිකා නැගණියන්ටත්, නන්දා අක්කාටත් ස්තුතියි.

කොවිඩ් 19 වසංගතයෙන් අගුළු වැටුණු නිවහන තුළ 2020 මාර්තු මාසයේ පටන් මේ වන තෙක් ගත වූ කාලය හරවත් සද්කාර්යයක් වෙනුවෙන් කැප කිරීමට ලැබීම මහත් සතුටක් මෙන් ම භාග්‍යයක්. නිරන්තරව දුරකථනවලින් සම්බන්ධ වෙමින්, විදුලි තැපෑලෙන් මෙන් ම වෙනත් තාක්ෂණික මෘදුකාංග මඟින් තොරතුරු හුවමාරු කරගනිමින් ගත කළා වූ නව මසක කාලය සැබවින් ම අර්ථාන්විත වූවා යැයි සිතෙයි. එකී කාලය මෙවන් හරවත් දෙයක් වෙනුවෙන් ගත කරන්නට අවශ්‍ය නීරෝගී බව ඒ වසංගත රැල්ලේ දී රැකෙන්නට ඇත්තේ අනඳපතිතුමා පැතූ සේ ම "ආනන්දයේ සරණ" නිසා වෙන්නට ඇතැයි හඟිමි. ආනන්දයෙන් නන් අයුරින් අප ලද පන්නරය "අනඳපති" ලිවීමේදීත් සරණ වූ බව තරයේ අදහන්නෙමි. එනයින්, මේ පුණ්‍යානුමෝදනාව සියලු ගුරු ඇදුරන්, සොයුරු ආනන්දයීයන් ඇතුළු මුළුමහත් ආනන්ද විද්‍යාලයටයි.

සිහිනයකිනුදු නොසිතූ ලෙස මව්බිමේ විශිෂ්ටතම අධ්‍යාපනඥයකු වන ආනන්ද විද්‍යාලයාධිපති කර්නල් ජී. ඩබ්ලිව්. රාජපක්ෂයන්ගේ චරිතාපදානය ලියන්නට මා තෝරා ගනු ලැබුවේ ලියන්නෙකු ලෙස ආදි ආනන්දයීයන් මා හඳුනාගෙන ඇති නිසයි. මගේ කුඩා අතින් අල්ලාගෙන මට තමන්ගේ අකුරු හුරු කරවා බසට නැමියාවක් ඇති කළ අම්මාටත්, සෑම නිවාඩුවකම කොහේ හෝ ගමනක් කැඳවා ගෙන ගොස් ගෙදර ආ විට ඒ පිළිබඳව රචනා ලියන්නට මා උනන්දු කරමින් මා හට ළමා වියේ පටන් ම අතිරේක පොතපත කියැවීමට ළං කර දුන් තාත්තාටත් පුණ්‍යානුමෝදනා පිරිනැමීම මාගේ යුතුකමක් ලෙස සලකමි. මේ කර්තව්‍ය වෙනුවෙන් ජානමය ශක්තිය මට ලබාදුන් දෙමව්පිය දෙපළට පින්...!

මේ සටහන නිම කරනා 2020 දෙසැම්බර් 31 වන අද දිනට දේශබන්දු කර්නල් ජී. ඩබ්ලිව්. රාජපක්ෂයන්ගේ සියවන ජන්ම දිනය යෙදෙයි. මේ සා දිගට ලියන්නට හැකිවේ යැයි මේ වගකීම පැවරුණ අවස්ථාවේ නොසිතුව ද වසර සියයකටත් වඩා දිගු මෑත ඉතිහාසයක් "අනඳපති" තුළ ලියා තබන්නට හේතුව වන්නේ රාජපක්ෂයන් පිළිබඳව ලැබුණ තොරතුරු සමුදායත්, එතුමන්ගේ වටපිටාවත් නිසයි. ලැබූ වැදගත් තොරතුරු සහ දත්ත, ඇසූ-කියවූ රසවත් සිද්ධි, රාජපක්ෂයන්ට ම අනන්‍ය වූ චින්තන රටා එතුමන් ලියූ-කියූ දේ ඇසුරින් ඔස්ට්‍රේලියාවේ වික්ටෝරියානු ප්‍රාන්තයේ පළමුවන කොරෝනා 19 වසංගත රැල්ල වසාලන්නට මම සමත් වූයෙමි. මේ සියල්ල අප වෙත ඉතිරි කොට වසර 1999 ඔක්තෝබර් 3 වනදා සිය දිවි සැරියෙන් සමුගත් දේශබන්දු කර්නල් ජෝර්ජ් විල්ප්‍රඩ් රාජපක්ෂ අනඳපතිතුමාට අවසන් වශයෙන් අපගේ ගෞරවාන්විත පුණ්‍යානුමෝදනාව පැමිණවෙයි.

එතුමන්ට නිවන් සුව!

ස්තුතියි.

**සිසිර දිසානායක**

2020 දෙසැම්බර් 31
25 Allister Street
Mount Waverley
Victoria 3149
Australia.